## 269 තෙදැති ඔද ඇති

තෙදැති ඔද ඇති දේව රජිඳේ
තිතින ඔබ ලොව සැරදේවා
සදාතනික වූ ඔබේ ප්‍රේමෙන්
මෙලොව ජනයා ඉපිලෙවා

තිලෝ අධිපති මැවුම් කරුණේ
තිලෝ සතගේ මිදුම් කරුණේ
මඟද සත්‍යද ජීවයද වන
ඔබ පසසමු තිතින සැම තැන

පව්ටු අප පව් කමා කරලන
සැම සිත් තම පෙමින් පුරවන
සාම ප්‍රීතිය ලොවට ගෙන දෙන
ඔබ දිනේවා සදා සැම තැන

නිතර අප සමඟින්ම වසනා
අවැසි යහපත් සැම සපුරනා
දිවිය අපගේ සදා සරු කළ
ඔබ දිනේවා සදා සැමතැන